දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේඅංකය )
எனது இல ) 01(11)/16/2013T
My No. )

ඔබේඅංකය )
உமது இல )
Your No. : )

දිනය )2017.07. 31
திகதி )
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

---

පොදු චක්‍රලේඛ ලිපි අංක: 02 - 179 / 2016 (ii)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
ශික්ෂණ රෝහල් සහ මහ රෝහල් අධ්‍යක්ෂවරුන්
මූලික රෝහල් වල වෛද්‍ය අධිකාරිවරුන්
ඇතුළු සියලුම ආයතන ප්‍රධානීන් වෙත

<u>නව හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද පොදු චක්‍රලේඛ ලිපි අංක 02-179/2016 හා 2016.10.25 දිනැති පොදු චක්‍රලේඛය හා 02-179/2016(1) හා 2016.11.22 දිනැති සංශෝධිත පොදු චක්‍රලේඛය හා බැඳේ.

02. හෙද ව්‍යවස්ථාවට අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) ලෙස නව ශ්‍රේණියක් ඇතුලත් කරමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1837/8 හා 2013.11.19 දිනැති ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාව ගැසට් අංක 2022/18 හා 2017.06.07 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධනය කරන ලදී.

03. ඒ අනුව හෙද සේවා ව්‍යවස්ථාවේ 10.3 වගන්තිය අනුව සුදුසුකම් සපුරාලන 1 ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරේ සිටින නිලධාරීන් අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස් කිරීම සඳහා මෙම චක්‍ර ලේඛය සමඟ නිකුත් කරන ආකෘති පත්‍ර අංක 04 අදාල කර ගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

04. අදාල උසස්වීම් සඳහා අයදුම්පත් යොමු කිරීමේදී පහත විධිවිධාන අනුව කටයුතු කලයුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

I. අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට පත් කල හැක්කේ 1 ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරෙහි සිටි නිලධාරියෙකු පමණි.

II. නිලධාරීන්ගේ 1 ශ්‍රේණියේ වසර 10ක සේවා කාලය ගණනය කිරීමේදී අදාල නිලධාරීන් 1 ශ්‍රේණියට හෝ 1 ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස් වූ දිනය යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනයේ සිට සේවා කාලය ගණනය කල යුතුය.

III. යම් නිලධාරියෙකු 1 ශ්‍රේණියේ වසර 10ක සේවා කාලය සපුරාලන්නේ 2010.11.01 දිනට පෙර දිනකදී නම් අදාල නිලධාරියා 2010.11.01 දිනට අධි ශ්‍රේණියට උසස් කල යුතුය.

---

IV. යම් නිලධාරියෙකු 1 ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස්වූ දිනයට පෙර 1 ශ්‍රේණියේ වසර 10ක සේවා කාලයක් සපුරා අධි ශ්‍රේණියට උසස් කිරීමට සුදුසුකම් සපුරාලන්නේ නම් ඔවුන් 02-179/2016 හා 2016.10.25 දිනැති පොදු චක්‍රලේඛය හා 02-179/2016(1) හා 2016.11.22 දිනැති සංශෝධිත පොදු චක්‍ර ලේඛයේ විධිවිධාන වලට අනුව අධි ශ්‍රේණියට උසස් කල යුතුය. ඉන්පසු අදාල නිලධාරීන් 1 ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස් වූ දිනයේ සිට අධි ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස් කල යුතුය.

ජනක සුගතදාස
ලේකම්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ජනක සුගතදාස
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

පිටපත්

01. සියලුම පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් - අ.ක.ස / දැ.ගැ.ස
02. සියලුම පලාත් සෞඛ්‍ය ලේකම්වරුන් - අ.ක.ස / දැ.ගැ.ස
03. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - අ.ක.ස / දැ.ගැ.ස

**<u>හෙද සේවයේ 1 ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරේ සිට අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස් කිරීම සඳහා අයදුම් පත්‍රය</u>**

1(කොටස) : (අදාළ නිලධාරිණිය/නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය.)

01.(අ) නිලධාරිණිය/නිලධාරියාගේ මුලකුරු සමඟ නම:........................................................................

.......................................................................................................................................

(ආ) සම්පූර්ණ නම:..........................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(ඇ)ජාතික හැඳුනුම්පත් අංකය:..........................................................

02.සේවා ස්ථානය:.............................................................................................................

03. වර්තමාන තනතුර.........................................................................................................

04.සිසු හෙද පුහුණුවට බැඳුණු දිනය:.....................................................................................

05.මාණ්ඩලික හෙද ලෙස මුල් පත්වීම් ලද දිනය:.......................................................................

06. (අ) හෙද සේවා ව්‍යවස්ථාවේ 20.1.3.2 වගන්තියේ විධි විධාන ප්‍රකාරව තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීමට සුදුසුකම් සපුරා තිබේද? ................................................................

.......................................................................................................................................

07. හෙද සේවයේ 1 ශ්‍රේණියට උසස් වූ දිනය.............................................................................

08. හෙද සේවයේ 1 ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට පත් වූ දිනය.......

.......................................................................................................................................

09. (අ) හෙද සේවයේ 1 ශ්‍රේණියේ හෝ 1 ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරෙහි හෝ එම අවස්ථා දෙකෙහිම හෝ අවුරුදු දහයක (10) සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය:.................................................................................................................................

(ආ) ඉහත 09 (අ) හි සඳහන් දිනට පෙර වසර 10 තුල සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබේ ද?:

.......................................................................................................................................

(ඇ)සියලුම වැටුප් වර්ධක නියමිත දිනයට උපයාගෙන නොමැති නම් ඊට හේතු..................................

.......................................................................................................................................

.......................................................................................................................................

10.(අ)උසස්වීම් දිනට පූර්වාසන්න වසර 05 තුල විනය පරීක්ෂණ හෝ විනය දඬුවම් කිසිවක් ඇද්ද?............

.......................................................................................................................................

(ආ)විනය දඬුවම් ලබා තිබේ නම් එහි විස්තර ...............................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

ඉහත 01 සිට 10 දක්වා තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කරමි.

දිනය.................................. ..................................................

නිලධාරිණිය/නිලධාරියාගේ අත්සන

විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි නිර්දේශය

ඉහත නිලධාරියා මාගේ අධීක්ෂණය යටතේ රාජකාරි සිදු කරන බවත් ඇය/ඔහු සතුටුදායක ලෙස රාජකාරි ඉටුකරන බැවින් .................................. ශ්‍රේණියට උසස් කිරීමට අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

දිනය.....................................................

.............................................................................

විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරියාගේ අත්සන හා නම සහිත නිල මුද්‍රාව

2(කොටස) : (විෂය භාර නිළධාරිණිය/නිළධාරියා විසින් අදාළ නිළධාරිණියගේ/නිළධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය.)

11.(අ) නිළධාරිණිය/නිළධාරියා ප්‍රසූත නොවන වැටුප් රහිත නිවාඩු ලබා තිබේද?..........................................

(ආ) ප්‍රසූත නොවන වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් එම කාල සීමාව ..............................................

..............................................................................................................................................

12. නිළධාරිණිය/නිළධාරියා 1 ශ්‍රේණියට උසස් වූ දිනය..........................................................................

13.(අ) නිළධාරිණිය/නිළධාරියා 1 ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස් වූ දිනය..............................................................................................................................

(ආ) නිළධාරිණිය/නිළධාරියා හෙද සේවයේ 1 ශ්‍රේණියේ හෝ 1 ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරෙහි හෝ එම අවස්ථා දෙකෙහිම හෝ අවුරුදු දහයක (10) සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය ......................................................................................

(ඇ) ඉහත 13 (ආ) හි සඳහන් දිනට පෙර වසර 10 තුල සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබේ ද?
..............................................................................................................................

(ඉ)එසේ නොමැති නම් ඊට හේතු.............................................................................................

..............................................................................................................................

..............................................................................................................................

14. නිළධාරිණිය/නිළධාරියා අධි ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස්වීම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇත් ද?
..............................................................................................................................

15.(අ) නිළධාරිණියට/නිළධාරියාට විරුද්ධව විනය පරීක්ෂණ හෝ විනය දඩුවම් කිසිවක් තිබේද?.............

..............................................................................................................................

(ආ)විනය පරීක්ෂණ හෝ විනය දඩුවම් තිබේ නම්

I. වරද කළ දිනය..........................................................................................
II. චෝදනා පත්‍ර නිකුත් කර තිබේ නම් අංකය හා දිනය (පිටපතක් අමුණන්න) ..............................
..............................................................................................................................
III. විනය නියෝගයක් ලබා දී තිබේ නම් එහි අංකය හා දිනය (පිටපතක් අමුණන්න) ......................
..............................................................................................................................

16. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පූර්වාසන්න වසර 10 තුල කාර්ය සාධන මට්ටම ඉතා හොඳයි/හොඳයි/සතුටුදායකයි/අසතුටුදායකයි ලෙස සටහන් කරන්න. (එසේම අදාල කරගත් කාර්ය සාධන වාර්තාවේ පිටපත අමුණන්න)

| | |
|---|---|
| 1 වසර ........................................ | 6 වසර ........................................ |
| 2 වසර ........................................ | 7 වසර ........................................ |
| 3 වසර........................................ | 8 වසර ........................................ |
| 4 වසර........................................ | 9 වසර ........................................ |
| 5 වසර........................................ | 10 වසර ........................................ |

17. හෙද සේවා ව්‍යවස්ථාවේ 20.1.3.2 වගන්තියේ විධි විධාන ප්‍රකාරව තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීමට සුදුසුකම් සපුරා තිබේද?....................................................................................
........................................................................................................................................

අදාළ නිලධාරිණියගේ/නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ඉහත දක්වා ඇති විස්තර හා අයදුම්පතේ 1 සිට 17 දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය..........................................  ..........................................................................

විෂයභාර නිලධාරිණිය/නිලධාරියාගේ අත්සන

3(කොටස) : (පරිපාලන නිලධාරිණිය/නිලධාරියාගේ නිර්දේශය)

අදාළ නිලධාරිණිය/නිලධාරියාගේ ඉහත දක්වා ඇති විස්තර හා අයදුම්පතේ 1 සිට 17 දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත් අධි ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස් කිරීම සුදුසු බවත් නිර්දේශ කරමි.

දිනය................................................  ..................................................................

පරිපාලන නිලධාරියාගේ අත්සන හා නම සහිත නිල මුද්‍රව

4(කොටස) : ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

හෙද නිලධාරි/නිලධාරිණි ........................................................................................ මයා/මෙය/මිය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ හෙද සේවයේ 1 ශ්‍රේණියේ සේවා කාලය* ..................................................... දිනට වසර දහයක් (10) සපිරෙන බවත් ඔහු/ඇය තෙවන කාර්යක්ෂමතා පරීක්ෂණය නිදහස් බවත් සහතික කරන අතර** ........................................................ දින සිට හෙද සේවයේ අධි ශ්‍රේණියේ (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස් කිරීම සුදුසු බවත් නිර්දේශ කරමි.

දිනය................................................  ..................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නම සහිත නිල මුද්‍රව

<u>සැළකිය යුතුයි</u>

* නිලධාරීන්ගේ 1 ශ්‍රේණියේ වසර 10ක සේවා කාලය ගණනය කිරීමේදී අදාල නිලධාරීන් 1 ශ්‍රේණියට හෝ 1 ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා/ මහජන සෞඛ්‍ය/ අධ්‍යාපන) තනතුරට උසස් වූ දිනය යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනයේ සිට සේවා කාලය ගණනය කල යුතුය.

** යම් නිලධාරියෙකු 1 ශ්‍රේණියේ වසර 10ක සේවා කාලය සපුරාලන්නේ 2010.11.01 දිනට පෙර දිනකදී නම් අදාල නිලධාරියා 2010.11.01 දිනට අධි ශ්‍රේණියට උසස් කල යුතුය.